# 6

# රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සහ රාජ්‍ය මූල්‍ය කටයුතු

රජයේ ආදායම් රැස්කිරීම හා වියදම් තාර්කීකරණය සඳහා වූ රජයේ සැලසුම්වලට දැඩි ලෙස බලපාන ලද කොවිඩ්-19 ව්‍යාප්තිය මධ්‍යයේ රාජ්‍ය මූල්‍ය කටයුතු, 2020 වසරේ ජනවාරි සිට ජූලි දක්වා කාලය තුළ දී සැලකිය යුතු අභියෝගයන්ට මුහුණ දෙන ලදී. 2020 වසර සඳහා පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද වාර්ෂික අයවැයක් නොමැති තත්ත්වයක් තුළ, රාජ්‍ය මූල්‍ය කටයුතු, අතුරු සම්මත ගිණුම් හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන මගින් අතිගරු ජනාධිපතිතුමන්ට හිමි බලතල යටතේ පවත්වාගෙන යෑමට රජය විසින් පියවර ගන්නා ලදී. ඒ අනුව, 2020 වසරේ ජනවාරි සිට අප්‍රේල් කාලය තුළ රාජ්‍ය මූල්‍ය මෙහෙයුම්, 2019 වසරේ නොවැම්බර් මාසයේ පැවැති ජනාධිපතිවරණයෙන් පසු වාර්ෂික අයවැයක් ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් කාලයක් නොපැවතීම හේතුවෙන්, 2019 ඔක්තෝබර් මාසයේ දී අනුමත කරන ලද අතුරු සම්මත ගිණුම මගින් සැලසුම් කරන ලදී. වාර්ෂික අයවැයක් හෝ අතුරු සම්මත ගිණුමක් අනුමත වීමට පෙර 2020 මාර්තු 03 වන දින පාර්ලිමේන්තුව විසුරුවා හැරීම සහ කොවිඩ්-19 ව්‍යාප්තිය මධ්‍යයේ මහ මැතිවරණය පැවැත්වීම ප්‍රමාදවීම යනාදි හේතු නිසා රාජ්‍ය සේවාවන් පවත්වාගෙන යෑම සඳහා ඒකාබද්ධ අරමුදලින් වියදම් සිදු කිරීම අතිගරු ජනාධිපතිතුමන්ට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව සිදු විය. 2020 අගෝස්තු මහ මැතිවරණයෙන් පසුව, 2020 වසරේ අවසන් මාස හතර සඳහා තවත් අතුරු සම්මත ගිණුමක් 2020 අගෝස්තු 28 දින පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදී. මේ අතර, කොවිඩ්-19 වසංගතයෙන් ආර්ථික ක්‍රියාකාරකම් මත ඇති වූ බලපෑම පිළිබිඹු කරමින්, 2020 වසරේ ජූලි මාසයෙන් අවසන් වන මාස හත තුළ රජයේ ආදායම පෙර වසරේ එම කාලයට සාපේක්ෂව පහළ යෑමක් පෙන්නුම් කරන ලදී. රජයේ වියදම් සැලකූ විට, ප්‍රධාන වශයෙන් වැටුප් සහ වේතන හා සහනාධාර සහ වර්තන පැවරුම්වල වැඩිවීම හේතුවෙන් පෙර වසරේ අදාළ කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2020 වසරේ සලකා බලන කාලය තුළ පුනරාවර්තන වියදම් වැඩි වූ අතර, ආදායම පහළ යෑම හේතුවෙන් සීමා වූ රාජ්‍ය මූල්‍ය අවකාශය, 2019 වසරේ සිට ඉදිරියට ගෙන එන ලද විශාල ප්‍රමාණයක නොගෙවූ බිල්පත්, කොවිඩ්-19 ව්‍යාප්තිය හමුවේ නව ප්‍රාග්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක නොවීම සහ අයවැය ප්‍රතිපාදන නොමැති වීම යනාදී හේතු නිසා ප්‍රාග්ධන වියදම් පහළ ගියේය. ප්‍රාග්ධන වියදමේ මෙම පහළ යෑම පුනරාවර්තන වියදමේ ඉහළ යෑම අභිබවා ගිය අතර, එහි ප්‍රතිඵලයක් ලෙස සමස්ත වියදම් සහ ශුද්ධ ණය දීම් 2020 වසරේ ජූලි මාසයෙන් අවසන් වන මාස හත තුළ, 2019 වසරේ එම කාලපරිච්ඡේදයට සාපේක්ෂව අඩු වීමක් පිළිබිඹු කරන ලදී. කෙසේ වුව ද, රජයේ ආදායමේ අඩු වීම රජයේ වියදම් පහත වැටීම ඉක්මවා ගිය අතර, එහි ප්‍රතිඵලයක් ලෙස, ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂයන් වන අයවැය ශේෂය, ප්‍රාථමික ශේෂය හා ජංගම ගිණුමේ ශේෂය 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2020 වසරේ ජූලි මාසයෙන් අවසන් වන මාස හත තුළ යම් පසුබෑමකට ලක් විය. 2019 වසරේ සිට ඉදිරියට ගෙන එන ලද නොපියවූ බිල්පත් රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් මත පීඩනයක් ඇති කළ අතර, 2020 වසරේ ජූලි මාසයෙන් අවසන් වන මාස හත තුළ අයවැය හිඟය ප්‍රසාරණය වීම සඳහා ද දායක විය. අයවැය හිඟය මූල්‍යනය සඳහා වන ශුද්ධ ණය ගැනීම්වල ඉහළ යෑම සහ එ.ජ. ඩොලරයට එරෙහිව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීමේ බලපෑම පෙන්නුම් කරමින්, 2019 වසර අවසානයට සාපේක්ෂව 2020 ජූලි මාසය අවසානය වන විට නොපියවූ මධ්‍යම රජයේ ණය ශේෂය ඉහළ ගියේය. අයවැය හිඟය මූල්‍යනයේ දී, 2020 වසරේ ජනවාරි සිට ජූලි කාලය තුළ රජය දේශීය මූලාශ්‍ර මත රඳා පැවති අතර, විදේශීය මූල්‍යනය ශුද්ධ ණය ආපසු ගෙවීමක් ලෙස වාර්තා විය. 2020 වසරේ දී ජාත්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන විසින් ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් පහත හෙලීම නිසා ඇති වූ අහිතකර සමපේක්ෂණ අපේක්ෂා සහ අවිනිශ්චිතතා දුරු කරමින්, 2020 වසරේ ඔක්තෝබර් මස මුල දී කල්පිරුණ ලද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරය ඇතුළුව මේ දක්වා ඇති සියලුම ණය සේවාකරණ ගෙවීම් නිසි පරිදි පියවන ලදී. කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ආර්ථිකය පසුබෑමේ බලපෑම පිළිබිඹු කරමින් 2020 වසර තුළ දී ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂයන් මන්දගාමී කාර්යසාධනයක් පෙන්නුම් කෙරෙනු ඇතැයි අපේක්ෂිත අතර, ආර්ථික ක්‍රියාකාරකම්වල අපේක්ෂිත පුනර්ජීවනයත් සමඟ එම ශේෂයන් 2021 වසරේ සිට වැඩිදියුණු වනු ඇත.

## රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග

- **දේශපාලන අංශයේ සිදු වූ වෙනස්වීම් සහ කොවිඩ්-19 ව්‍යාප්තිය, 2020 වසරේ දී රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග කෙරෙහි විශාල ලෙස බලපෑම් ඇති කළේය.** 2019 වසරේ නොවැම්බර් මස ජනාධිපතිවරණයෙන් පසුව 2020 වසර සඳහා ජාතික අයවැයක් ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් කාලයක් නොපැවතීම හේතුවෙන් 2019 වසරේ ඔක්තෝබර් මස පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද අතුරු සම්මිත ගිණුමට අනුව 2020 වසරේ ජනවාරි සිට අප්‍රේල් දක්වා කාලය තුළ රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් සැලසුම් කරන ලදී. මේ අතර, වාර්ෂික අයවැයක් හෝ අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කිරීමට පෙර 2020 වසරේ මාර්තු 03 වන දින පාර්ලිමේන්තුව විසුරුවා හරින ලද අතර, කොවිඩ්-19 ව්‍යාප්තිය මධ්‍යයේ මහ මැතිවරණය පැවැත්වීම ප්‍රමාද විය. එබැවින්, අතිගරු ජනාධිපතිතුමාට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පැවරී ඇති බලතල යටතේ 2020 වසරේ මාර්තු මස 06 වන දින සිට 2020 වසරේ අගෝස්තු මස 31 වන දින දක්වා කාලය තුළ රාජ්‍ය සේවාවන් සඳහා ඒකාබද්ධ අරමුදලෙන් වියදම් සිදු කිරීම සඳහා පහසුකම් සලසන ලදී. 2020 වසරේ අගෝස්තු මස පැවති මහ මැතිවරණයෙන් පසුව, 2020 වසරේ අවසන් මාස හතර සඳහා තවත් අතුරු සම්මත ගිණුමක් 2020 වසරේ අගෝස්තු මාසයේ දී පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදී. මේ අතර, 2020 මුදල් වර්ෂය සඳහා අදාළ විසර්ජන පනත් කෙටුම්පත 2020 වසරේ ඔක්තෝබර් මස 06 වන දින ගැසට් කරන ලදී.[1]

- **2019 වසරේ අග පැවති ජනාධිපතිවරණයෙන් පසුව හඳුන්වා දුන් රාජ්‍ය මූල්‍ය උත්තේජක පියවර මගින් ආර්ථික ක්‍රියාකාරකම්වල අපේක්ෂිත පුනර්ජීවනය සාක්ෂාත් කර ගැනීම, කොවිඩ්-19 වසංගතය නිසා අභියෝගයට ලක් විය.** කොවිඩ්-19 හේතුවෙන් ආර්ථික ක්‍රියාකාරකම් තාවකාලිකව නවතා දැමීම මධ්‍යයේ සිදු වූ ආර්ථික කටයුතු මන්දගාමී වීම නිසා රාජ්‍ය මූල්‍ය උත්තේජක ක්‍රියාමාර්ගවලින් රජයේ ආදායම වෙත සිදු වූ කෙටිකාලීන ඍණාත්මක බලපෑම උග්‍ර විය. ඒ අනුව, 2020 වසරේ දී ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස රජයේ ආදායම මෙතෙක් වාර්තා වී ඇති පහළම මට්ටමක් දක්වා අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. රජයේ ආදායමේ අපේක්ෂිත පහළ යෑම, පුනරාවර්තන වියදම් ඉහළ යෑම සහ පෙර වර්ෂයේ සිට ඉදිරියට ගෙන එන ලද හිඟ ගෙවීම් පියවීම හේතුවෙන් 2020 වසරේ දී රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය කැපී පෙනෙන ලෙස පහළ යා හැකිය.

- **කොවිඩ්-19 වසංගතයෙන් පීඩාවට පත් ව්‍යාපාර සහ පුද්ගලයින්ට සහන සැපයීම අරමුණු කරගත් රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග රැසක් ආරම්භ කරන ලදී.** තෝරාගත් සෞඛ්‍ය ආශ්‍රිත උපකරණ ආනයනය කිරීමේ දී එම උපකරණ, වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්දෙන් සහ සෙස් බද්දෙන් නිදහස් කරන ලදී. 2020 පෙබරවාරි සහ මාර්තු මාස සඳහා රඳවා ගැනීමේ බද්දෙහි අදාළ ගෙවීම් සහ එකතු කළ අගය මත බද්දෙහි ගෙවීම් සිදු කිරීමට අදාළ කාල සීමාවන් 2020 අප්‍රේල් 30 දක්වා දීර්ඝ කරන ලද අතර, ආර්ථික හා සාමාජීය කටයුතු තාවකාලිකව නවතා දමන ලද කාල සීමාව තුළ දී සියලුම බදු සඳහා වූ දඩ මුදල් ගෙවීමෙන් නිදහස් කිරීම සහ 2020 ජූලි මාසයේ සිට ප්‍රමාද වී කරනු ලබන ගෙවීම් සඳහා වන දඩ මුදල් අය කිරීම ආරම්භ කිරීම සම්බන්ධව උපදෙස් නිකුත් කරන ලදී. 2018/2019 තක්සේරු වර්ෂය දක්වා නිකුත් කරන ලද තක්සේරු කිරීම් සඳහා වූ ආදායම් බදු හිඟ මුදල් ඉවත් කිරීම, 2019/2020 තක්සේරු වර්ෂය සඳහා අතිරේක තක්සේරු කිරීම් නිකුත් නොකිරීම, බදු හිඟ/පැහැර හැරීම් පියවීම සඳහා සහන කාලයක් ලබා දීම, අත්පත් කර ගැනීමේ නිවේදන දීර්ඝ කිරීම සහ බදු ගෙවීම් සහ බදු වාර්තා පිරවීම සඳහා දීර්ඝ කාල සීමාවක් ලබා දීම වැනි කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට ලබා දුන් විවිධ බදු සහන ක්‍රියාමාර්ග මගින්, බලපෑමට ලක් වූ ව්‍යාපාරවලට තාවකාලික මුදල් ප්‍රවාහ සහනයක් ලබා දෙන ලදී.

- **2020 වසර තුළ දී ක්‍රියාත්මක කරන ලද බදු සහන සම්බන්ධයෙන් 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතට අදාළ සංශෝධන සිදු වෙමින් පවතී.** දේශිය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2019 වසරේ අග ප්‍රකාශයට පත් කළ අයුරින්, එම බදු සහන පාර්ලිමේන්තුවේ අනුමැතියට යටත්ව 2020 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක විය.[2] පවත්නා ආදායම් බදු ව්‍යුහය




1 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 (2) වගන්තිය යටතේ යෝජනා සම්මත කර ඇති සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 (3) වගන්තිය යටතේ බලය පවරන ලද ඇතැම් වියදම් හා අත්තිකාරම් 2020 මුදල් වර්ෂය සඳහා වන විසර්ජන පනතෙහි පළමු, දෙවන හා තෙවන උපලේඛනයන්ට ඇතුළත් වීමට නියමිත අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 (2) වගන්තිය යටතේ යෝජනා සම්මත කර ඇති ණය ගැනීම් විසර්ජන පනතේ 2 (1) (ආ) වගන්තිය යටතේ ඇතුළත් වනු ඇත. 2021 මුදල් වර්ෂය සඳහා වන විසර්ජන පනත් කෙටුම්පත ද 2020 ඔක්තෝබර් 06 වන දින ගැසට් කරන ලදී.

2 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතට යෝජිත සංශෝධන 2020 අගෝස්තු 26 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර, මෙම සංශෝධන නීති කෙටුම්පත්කරු වෙත යවා ඇත. මීට අමතරව, ආර්ථික සේවා ගාස්තු ඉවත් කිරීමට අදාළ 2020 අංක 4 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත 2020 ඔක්තෝබර් 12 දින බලාත්මක කරන ලදී. තව ද, 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ සංශෝධන 2020 අගෝස්තු 26 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර, මෙම සංශෝධන නීති කෙටුම්පත්කරු වෙත යවා ඇත.

**6.1 රූප සටහන**

## රාජ්‍ය මූල්‍ය අංශයේ කාර්යසාධනය




6

සරල කිරීම සහ ආර්ථික ක්‍රියාකාරකම් පුනර්ජීවනය සඳහා සහය සැපයීම සඳහා බදු සහන ලබා දීම යෝජිත සංශෝධනවල ප්‍රධාන අරමුණු වේ. ඒ අනුව, තනි පුද්ගල ආදායම් බදු අනුපාතික, බදු නිදහස් සීමාව සහ බදු කාණ්ඩ යනාදිය සඳහා සංශෝධන හඳුන්වා දෙන ලදී. සේවා නියුක්ති ආදායම සඳහා වාර්ෂිකව රුපියල් මිලියන 1.2ක් සහ තනි පුද්ගල ආදායම සඳහා වාර්ෂිකව රුපියල් 500,000ක්ව පැවති බදු නිදහස් සීමාව ඕනෑම ආදායම් මාර්ගයක් සඳහා වාර්ෂිකව රුපියල් මිලියන 3.0ක් දක්වා ඉහළ නංවන ලදී. බදු නිදහස් සීමාවට ඉහළින් ඇති බදු අය කළ හැකි ආදායම සඳහා වන ආදායම් බදු කාණ්ඩ වාර්ෂිකව රුපියල් 600,000 සිට රුපියල් මිලියන 3.0 දක්වා වැඩි කරන ලදී. තනි පුද්ගල ආදායම් බදු අනුපාතික සරල කරන ලද අතර, සියයට 4, සියයට 8, සියයට 12, සියයට 16, සියයට 20 සහ සියයට 24 ලෙස පෙර පැවති ආදායම් බදු අනුපාතිකයන් සියයට 6, සියයට 12 සහ සියයට 18 දක්වා සංශෝධනය කරන ලදී. මීට අමතරව, ඕනෑම නේවාසික හෝ අනේවාසික පුද්ගලයෙකුට ලැබෙන ඕනෑම සේවා නියුක්ති ආදායමක් මත අය කරන ලද උපයන විට ගෙවීමේ බද්ද 2020 ජනවාරි 01 දින සිට ඉවත් කරන ලදී. ඉන් පසුව, විකල්ප පදනමක් මත, 2020 අප්‍රේල් 01 දින සිට බලපැවැත්වෙන පරිදි උපයන විට ගෙවීමේ බද්ද වෙනුවට අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද හඳුන්වා දෙන ලදී. සේවා නියුක්තිකයන්ගේ අභිමතය ඇතිව නේවාසික සේවා නියුක්තිකයන්ගේ චේතනයෙන් අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද අඩු කරනු ලබන අතර, අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද ගෙවීමට අභිමතය නොදක්වන ඕනෑම නේවාසික සේවා නියුක්තිකයෙකු අදාළ බදු කාණ්ඩ සහ බදු අනුපාතික මත පදනම්ව පුද්ගල ආදායම් බදු ගෙවීමට බැඳී සිටී. කෙසේ වෙතත්, අනේවාසික සේවා නියුක්තිකයන් සම්බන්ධයෙන්, එලෙස සේවා නියුක්තිකයන්ගේ අභිමතය නොවිමසා අදාළ සේවායෝජකයා විසින් අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද චේතනයෙන් අඩු කරනු ඇත. මේ අතර, 2020 ජනවාරි 01 දින සිට ඉදිකිරීම් කර්මාන්තයට අදාළ වන සංස්ථාපිත ආදායම් බදු අනුපාතිකය සියයට 28 සිට සියයට 14 දක්වා අඩු කරන ලද අතර, බැංකු, මූල්‍ය, රක්ෂණ සේවා අංශයෙන් සහ වෙළඳ කටයුතු සඳහා වූ සංස්ථාපිත ආදායම් බදු අනුපාතිකය සියයට 28 සිට 24 දක්වා අඩු කරන ලදී. තව ද, 2020 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි රඳවා ගැනීමේ බදු සහ ආර්ථික සේවා ගාස්තු ඉවත් කරන ලදී. එසේ වුව ද, ලොතරැයි දිනුම්, ත්‍යාග, ඔට්ටු ඇල්ලීම හා සූදු ජයග්‍රහණ සඳහා ගෙවන මුදල්, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් පවත්වන ලද වෙන්දේසියක දී ඕනෑම මැණික් වර්ගයක් විකිණීම සහ ඕනෑම අනේවාසිකයෙකුට සිදු කරන ගෙවීම් මත අය කරන ලද රඳවා ගැනීමේ බද්ද තවදුරටත් අදාළ වේ.

- **විනිමය අනුපාතිකයට ඇති විය හැකි පීඩනයන් සැලකිල්ලට ගනිමින් අන්තර්ජාතික භාණ්ඩ මිලෙහි සිදු වන වෙනස්වීම්වලට අනුකූලව ආනයන බදුවල වෙනස්කම් කිහිපයක් සිදු කරන ලදී.** ඒ අනුව, පෙට්‍රල් සහ ඩීසල්වල දේශීය සිල්ලර මිල ගණන් පවතින මට්ටම්වලම පවත්වා ගනිමින් පෙට්‍රල් සහ ඩීසල් ආනයනය මත වූ ආනයන බද්ද ඉහළ නංවන ලද අතර, එම භාණ්ඩ ආනයනය මත අධිභාරයක් ද පනවන ලදී. මීට අමතරව, 2020 අප්‍රේල් මාසයේ දී කොවිඩ්-19 වසංගතය හමුවේ ගෙවුම් තුලනයට සහ විනිමය අනුපාතිකයට ඇති විය හැකි පීඩනය සැලකිල්ලට ගනිමින්, මත්ස්‍ය නිෂ්පාදන, ජමනාරං, ධාන්‍ය නිෂ්පාදන, තිරිඟු පිටි, එළවළු සහ යුෂ නිෂ්පාදන ඇතුළු පලතුරු නිෂ්පාදන, තේ සහ කෝපි නිස්සාරක සහ දුම්කොළ නිෂ්පාදන ආනයනය කිරීම යනාදිය මත පනවන ආනයන බද්ද සියයට 25-50 අතර පරාසයක් තුළ වැඩි කරන ලදී. 2020 වසරේ මේ දක්වා කාලය අතරතුර සිදු වූ ආනයන තීරු බදු වෙනස් කිරීම් මෙම වාර්තාවේ පරිශිෂ්ටය I (ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග) යන කොටසෙහි සවිස්තරාත්මකව දක්වා ඇත.

- **දේශීය නිෂ්පාදකයින්ට සහය දක්වමින්, දේශිය වෙළඳපොළ මිලෙහි අස්ථාවරත්වය අඩු කිරීම සඳහා තෝරාගත් භාණ්ඩ සඳහා විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද සංශෝධනය කරන ලදී.** මාළු (අලුත්, ශීත කළ හෝ හිමායිත), යෝගට්, අර්තාපල්, රතු ළූණු, ලොකු ළූණු, සුදු ළූණු, මෑ වර්ගයේ ඇට (පියලි කළ), කොණ්ඩ කඩල, රතු සහ කහ පරිප්පු (සම්පූර්ණ සහ පියලි කළ), රට ඉඳි (අලුත් සහ වියළි), මිදි (අලුත්), ඇපල් (අලුත්), පෙයාර්ස්, චෙරීස් (වෙනත්), ප්ලම්ස් සහ ස්ලෝස්, මිරිස් (කුඩු නොකළ හා නොඇඹරූ), බඩ ඉරිඟු, පොතු හරින ලද රටකජු, මාගරින්, ටින් මාළු, බීට් සහ උක් සීනි ආනයනය මත වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉහළ නංවන ලද අතර, ක්ලෙමන්ටයින් (අලුත් සහ වියළි), ග්‍රේප් ෆෘට් (අලුත් සහ වියළි පොමෙලෝස් ඇතුළුව), ලෙමන් (අලුත් සහ වියළි), ක්වින්ස්, ඇප්‍රිකොට්, ඇඹුල් චෙරීස්, පීච් (නෙක්ටරීන් ද ඇතුළුව), එළවළු මේද හා තෙල් සහ ඒවායේ අතුරු කොටස්, මාගරින් (වෙනත්), විෂබීජ නාශක

6

සහ මුහුණු ආවරණ ආනයනය යනාදිය මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පනවන ලදී. මීට අමතරව, 2020 පෙබරවාරි සිට ජූලි දක්වා කාලය තුළ මාළු (ජැක් සහ හෝර්ස් මැකරල්), දොඩම් (අලුත් සහ වියළි), මිදි (වියළි) සහ එළවළු තෙල් ආනයනය මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද සංශෝධනය කරන ලදී.

- **ආදායම් එකතු කිරීමේ ආයතනවල කාර්යක්ෂමතාව සහ ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා 2020 වසරේ දී බදු පරිපාලනය ශක්තිමත් කිරීම සඳහා පියවර කිහිපයක් හඳුන්වා දෙන ලදී.** ඒ අනුව, ස්වයංක්‍රීයකරණ ක්‍රියාවලිය වේගවත් කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා රේගුවේ රේගු දත්ත සඳහා වන ස්වයංක්‍රීය පද්ධතිය (ASYCUDA) සඳහා නවීකරණය කිරීම් කිහිපයක් හඳුන්වා දෙන ලදී. නිර්ලේඛන නිෂ්කාශන ක්‍රියාවලියට පහසුකම් සැලසීම සඳහා, රජයේ සමාජ දුරස්ථභාවය රැකීමේ මාර්ගෝපදේශයන්ට අනුගත වෙමින්, ආනයනකරුවන්ට පුද්ගලිකව පෙනී නොසිට ශ්‍රී ලංකා රේගුවට ලේඛන ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි රේගු දත්ත සඳහා ස්වයංක්‍රීය පද්ධතිය වෙනස් කරන ලදී. තව ද, රේගු දත්ත සඳහා ස්වයංක්‍රීය පද්ධතියේ බහාලුම් අවසරපත් ඉලෙක්ට්‍රොනික ලේඛනයට ද වෙනස්කම් හඳුන්වාදුන් අතර, එමගින් නිලධාරීන්ට කාර්යාලයට නොපැමිණ අදාළ විස්තර පරීක්ෂා කිරීමට හැකි වී ඇත. රේගු නිෂ්කාශනයට අදාළ කාර්යයන්හි කාර්යක්ෂමතාව සහ ඵලදායීතාව ඉහළ නැංවීමේ අරමුණින්, රේගු දත්ත සඳහා ස්වයංක්‍රීය පද්ධතියේ බහාලුම් අවසරපත් ඉලෙක්ට්‍රොනික ලේඛනයට ස්කෑන් පිටපත් ඇතුළත් කිරීම සඳහා යාන්ත්‍රණයක් සකස් කරන ලද අතර "(RAPISCAN)", පද්ධතියේ ඇති දත්ත මත පදනම් වූ ස්වයංක්‍රීය යාවත්කාලීන තේරීම් ලැයිස්තුවක් හඳුන්වා දෙමින් රේගු දත්ත සඳහා ස්වයංක්‍රීය පද්ධතියේ තෝරා ගැනීමේ මොඩියුලය ප්‍රතිනිර්මාණය කරන ලදී. තව ද, ඒකාබද්ධ භාණ්ඩාගාර මෙහෙයුම් කළමනාකරණ තොරතුරු පද්ධතිය (ITMIS) හරහා දෛනික ආදායම් රැස් කිරීම මුදල් අමාත්‍යාංශයට වාර්තා කිරීම සඳහා ශ්‍රී ලංකා රේගුවේ ආදායම් වාර්තා කිරීමේ මොඩියුලයක් සකස් කරන ලදී.

- **වර්ෂය තුළ රාජ්‍ය වියදම් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම දිරිගැන්වීම සඳහා රජය පියවර කිහිපයක් ක්‍රියාත්මක කළේය.** ඒ අනුව, කොවිඩ්-19 වසංගතයේ බලපෑමට ලක් වූ රාජ්‍ය ආදායම් රැස් කිරීම සැලකිල්ලට ගෙන, අත්‍යවශ්‍ය නොවන වියදම් කපා හරිමින්, වෙන් කරන ලද ප්‍රතිපාදන තුළ වියදම් සීමා කරන ලෙස සියලු අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත දැඩි ලෙස උපදෙස් දෙන ලදී. තව ද, 2020 පෙබරවාරි මාසයේ දී ජාතික වැටුප් කොමිෂන් සභාව ස්ථාපිත කළ අතර, එමගින් රාජ්‍ය අංශයේ මෙන් ම පෞද්ගලික අංශයේ ද වේතන ව්‍යුහයන් නැවත අධ්‍යනය කිරීමට සහ ජාතික වැටුප් ප්‍රතිපත්තියක් සැකසීමට හා ක්‍රියාත්මක කිරීමට රජයට උපදෙස් හා සහාය ලබා දෙනු ඇත.

- **කොවිඩ්-19 ව්‍යාප්ති කාලය තුළ දී විශ්‍රාමිකයින්ට සහනයක් සලසමින් විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රියාවලිය විධිමත් කිරීමට පියවර කිහිපයක් ගන්නා ලදී.** ඒ අනුව, ජීවත්වීමේ සහතික විද්‍යුත් ක්‍රමයට නිකුත් කිරීමේ ව්‍යාපෘතිය 2020 වසරේ මුල් භාගයේ දී ආරම්භ කරන ලද අතර, දැනට පවතින ප්‍රලේඛන ක්‍රියාවලිය වෙනුවට විශ්‍රාමිකයින්ට ඔවුන්ගේ ඇඟිලි සලකුණු මගින් තහවුරු කළ ජීවත්වීමේ සහතික ඉදිරිපත් කිරීමේ අවස්ථාව ලබා දී තිබේ. විශ්‍රාමිකයන්ගේ ජීවත්වීම/පදිංචිය තහවුරු කිරීම සඳහා සෑම වසරකම විශ්‍රාමික ජීවත්වීමේ සහතික ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත යැවීමේ අවශ්‍යතාව ඉවත් කරමින් විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රියාවලිය සරල කිරීම සහ ස්වයංක්‍රීය කිරීම මෙම ව්‍යාපෘතිය මගින් අපේක්ෂා කෙරේ. විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රියාවලියේ නිරවද්‍යතාවය සහ විශ්වසනීයත්වය ඉහළ නැංවීමේ අරමුණින්, දැඩි මානසික හෝ ශාරීරික අපහසුතාවන්ගෙන් පීඩා විඳින විශ්‍රාමිකයෙක් වේ නම් එම අදාළ විශ්‍රාමිකයාට විශ්‍රාම වැටුප ලබා ගැනීමට නොහැකි වන විට ඒ සඳහා භාරකරුවෙකු පත් කිරීමට විශ්‍රාමිකයන්ට පහසුකම් ලබා දී ඇත. තව ද, ගෙවීම් ක්‍රියාවලියේ නිරවද්‍යතාවය සහ කාර්යක්ෂමතාව සහතික කිරීම සඳහා අන්තර්ජාලය හරහා නව වැඩසටහනක් හඳුන්වා දීමෙන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් සක්‍රීය කිරීමේ කාර්යය ප්‍රාදේශීය ලේකම්වරුන්හට පවරන ලදී. තව ද, කොවිඩ්-19 වසංගතය නිසා ඇති වූ ප්‍රමාදයන් හේතුවෙන් විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රියාවලිය අවසන් නොකළ මැතක දී විශ්‍රාම ලබා ගත් රාජ්‍ය නිලධාරීන් සඳහා 2020 අප්‍රේල් සහ මැයි මාසවලදී රුපියල් 25,000ක මාසික දීමනාවක් ලබා දීම සඳහා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ පළාත් සභා වෙත අංක 08/2020 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය නිකුත් කළේය.

- **අඩු ආදායම්ලාභී කුටුම්භයන්හි ජීවන තත්ත්වය නංවාලීමේ අරමුණ සහ ඔවුන්ගෙන් ආර්ථිකයට ඵලදායී දායකත්වය ලබා ගැනීම සඳහා රජය විසින් නව බඳවා ගැනීමේ වැඩසටහනක් දියත් කරන ලදී.**

6

ඒ අනුව, අඩු ආදායම්ලාභී පවුල්වලින් නුපුහුණු පුද්ගලයන් 100,000ක් බඳවා ගැනීමේ වැඩපිළිවෙළ රජය විසින් 2020 ජනවාරි මාසයේ දී ආරම්භ කරන ලදී. තව ද, ආසන්නම වසර තුනක කාලයක් තුළ රැකියා විරහිතව සිටි උපාධිධාරීන් සහ ඩිප්ලෝමාධාරීන් 50,000කට රැකියා අවස්ථා ලබා දීම සඳහා රජය 2020 පෙබරවාරි මාසයේ දී තවත් බඳවා ගැනීමේ වැඩසටහනක් ආරම්භ කළේය. කෙසේ වෙතත්, මහ මැතිවරණය නිවේදනය කිරීමෙන් පසුව 2020 මාර්තු මාසයේ දී අත්හිටුවන ලද මෙම බඳවා ගැනීම් වැඩසටහන 2020 සැප්තැම්බර් මස මුල දී නැවත ආරම්භ කරන ලද අතර, මීට අමතරව තවත් උපාධිධාරීන් 10,000ක් බඳවා ගැනීමට ද අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත.

- **කොවිඩ්-19 වසංගතයෙන් පීඩාවට පත් සමාජයේ ආර්ථික දුෂ්කරතා ඇති පිරිසට සහාය වීම කෙරෙහි රජයේ සුභසාධන වැඩසටහන් තුළින් අවධානය යොමු කළ අතර, සුභසාධන ප්‍රතිලාභ මණ්ඩලයේ මෙහෙයුම් ශක්තිමත් කිරීමට ද පියවර ගන්නා ලදී.** ඒ අනුව, කොවිඩ්-19 වසංගතය තුළ ආර්ථික වශයෙන් අවදානමට ලක් වූ ජනතාව මුහුණ දී ඇති දුෂ්කරතා සැලකිල්ලට ගෙන, ජ්‍යෙෂ්ඨ පුරවැසියන්, විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්, වකුගඩු රෝගීන්, ගොවීන් සහ දෛනික රැකියා අහිමි වූ කම්කරුවන් වෙත 2020 අප්‍රේල් සහ මැයි මාසවල දී රුපියල් 5,000ක මුදල් දීමනාවක් ලබා දීමට පියවර ගන්නා ලදී. තව ද, ආර්ථික හා සාමාජීය කටයුතු තාවකාලිකව සීමා කරන ලද කාලය තුළ සමෘද්ධි ප්‍රතිලාභීන්ට රුපියල් 10,000ක පොලී රහිත අත්තිකාරම් මුදලක් ලබා දීමට රජය කටයුතු කළ අතර, පාරිභෝගික උපයෝගිතා බිල්පත් ගෙවීම සඳහා සාමාන්‍ය ජනතාවට මාසයක සහන කාලයක් ලබා දෙන ලදී. මීට අමතරව, කොවිඩ්-19 ව්‍යාප්තිය වැළැක්වීමේ කටයුතුවල නිරතවන පොලිස් නිලධාරීන්, ත්‍රිවිධ හමුදාව සහ රජයේ සේවකයින් සහ සෞඛ්‍ය අංශයේ නිලධාරීන් සඳහා අග්‍රහාර රක්ෂණ ප්‍රතිලාභ දෙගුණ කිරීමට කටයුතු කරන ලදී. සුභසාධන වැඩසටහන් හා සම්බන්ධ තොරතුරු ගබඩා කරන විද්‍යුත් දත්ත ගබඩාවක්වන, සමාජ ආරක්ෂණ තොරතුරු ජාලයේ ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට අවශ්‍ය දත්ත ලබා ගැනීම සඳහා සුභසාධන ප්‍රතිලාභ මණ්ඩලය සමෘද්ධි දෙපාර්තමේන්තුව සමඟ අවබෝධතා ගිවිසුමක් මෙම වසරේ දී අත්සන් කරන ලදී. විවිධ සුභසාධන වැඩසටහන් සඳහා ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ ක්‍රියාපටිපාටිය වැඩිදියුණු කිරීමට සමාජ ආරක්ෂණ තොරතුරු ජාලයේ ක්‍රියාකාරකම් අවසන් කොට එය ඒකාබද්ධ සුභසාධන කළමනාකරණ පද්ධතියක් දක්වා ව්‍යාප්ත කිරීමට අපේක්ෂිතයි. තව ද, සුභසාධන ප්‍රතිලාභ මණ්ඩලයේ ආයතනික ව්‍යුහය ශක්තිමත් කරන අතරම, සමාජ ආරක්ෂණ තොරතුරු ජාලයෙහි දෛනික මෙහෙයුම් නිරීක්ෂණය කිරීම සඳහා අධීක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීමට ද අපේක්ෂිතයි.

- **රජය සතු වාණිජ ව්‍යවසායයන්හි මූල්‍ය ශක්‍යතාව වැඩි දියුණු කිරීම සඳහා රජය ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග කිහිපයක් ගෙන ඇති අතර, එමගින් රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් මත ඇතිවන පීඩනය අවම කර ගැනීමට අපේක්ෂිතය.** ඒ අනුව, එම ආයතනවල මූල්‍ය ශක්‍යතාව ශක්තිමත් කිරීම පිණිස රජය සතු වාණිජ ව්‍යවසායයන්හි ප්‍රධාන තනතුරු සඳහා සුදුසු පුද්ගලයින් පත් කිරීම සඳහා 2020 වසර මුල දී විශේෂ කමිටුවක් පිහිටුවන ලදී. තව ද, දේශීයව ඛනිජ තෙල් මිලෙහි සිදුවන උච්චාවචනයන් අවම කරමින්, ගෝලීය වෙළඳපොළේ තෙල් මිල අඩුවීමේ ප්‍රතිලාභ වඩාත් පිරිමැසුම්දායකව හා සාධාරණව බෙදී යෑම සහතික කිරීම සඳහා ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදල පිහිටුවන ලදී. ඒ අනුව, 2020 මාර්තු 23 වන දින මහ බැංකුවට භාණ්ඩාගාර බිල්පත් නිකුත් කරමින් රැස් කළ රුපියල් බිලියන 50ක (මුහුණත් අගය මත) මූලික ප්‍රාග්ධනයක් යොදමින් ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදල පිහිටුවන ලදී. මේ අතර, පෙට්‍රල් සහ ඩීසල් ආනයන සඳහා අයකරනු ලබන අධිභාරවලින් ලබා ගත් ආදායම ද එම අරමුදලට බැර කරනු ලැබේ. 2020 වසර තුළ මේ දක්වා කාලය තුළ, ලංකා විදුලිබල මණ්ඩලයේ සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ හිඟ මුදල් පියවීම සඳහා ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදලෙන් කොටසක් භාවිතා කර ඇත.

- **2019 වසරේ දී නොවෙනස්ව පැවති ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම 2020 වසරේ දී පහත හෙළනු ලැබිය.** 2020 අප්‍රේල් සහ මැයි මාසවලදී ෆිච් ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනය (Fitch Ratings) සහ එස් ඇන්ඩ් පී ගෝලීය ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනය (S & P Global Ratings) ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම "B-" දක්වා පහත හෙළනු ලැබූ අතරම, ඉදිරි දැක්ම පිළිවෙළින් “සෘණ” සහ “ස්ථාවර” ලෙස තහවුරු කරන ලදී. 2020 අප්‍රේල් මාසයේ දී, ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම වූ "B2" පහත හෙළීම සඳහා

සමාලෝචනයක් ආරම්භ කළ මූඩීස් ආයෝජක සේවාව (Moody's Investors Service), 2020 සැප්තැම්බර් මාසයේ දී, ඉදිරි ණය සේවාකරණ ගෙවීම් සඳහා ඇති විය හැකි අභියෝග ඉස්මතු කරමින් ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම "Caal" දක්වා මට්ටම් දෙකකින් පහත හෙළනු ලැබූ අතර, ඉදිරි දැක්ම “ඍණ” සිට “ස්ථාවර” දක්වා සංශෝධනය කළේය. කෙසේ වෙතත්, 2020 ඔක්තෝබර් මස මුල දී කල් පිරුණු එ.ජ. ඩොලර් බිලියන 1ක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරය ඇතුළුව 2020 වසරේ මේ දක්වා වූ සියලුම ණය සේවාකරණ ගෙවීම් රජය විසින් නිසි ලෙස පියවා ඇත.

- **2018 අංක 8 දරන සක්‍රීය වගකීම් කළමනාකරණ පනත යටතේ 2019 වසරේ දී සම්පාදනය කර ගන්නා ලද අරමුදල් 2020 වසරේ මුල දී භාවිතා කරන ලද අතර, 2019-2023 කාලපරිච්ඡේදය සඳහා අදාළ මැදි කාලීන ණය කළමනාකරණ උපායමාර්ගය යටතේ සකස් කර ඇති ඉලක්ක 2020 වසරේ දී මේ දක්වා කාලය තුළ ප්‍රගතියක් වාර්තා කර ඇත.** සක්‍රීය වගකීම් කළමනාකරණ පනත යටතේ 2019 වසරේ දී එහි පළමු වගකීම් කළමනාකරණය පාදක කර ගත් භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුව සිදු වූ අතර, 2019 ඔක්තෝබර් මාසයේ දී නිකුත් කළ රුපියල් බිලියන 15කින් සහ 2019 දෙසැම්බර් මාසයේ දී නිකුත් කළ තවත් රුපියල් බිලියන 15කින් එය සමන්විත විය. 2019 වසරේ දී සම්පාදනය කළ එම අරමුදල් 2020 වසර මුල දී ණය සේවාකරණ ගෙවීම් සඳහා යොදා ගන්නා ලදී. අයවැය අවශ්‍යතා සඳහා අවම පිරිවැයකින් අරමුදල් සම්පාදනය කරන බව සහතික කිරීම සඳහා සුදුසු ණය උපකරණ සංයුතියක් ගොඩනැගීම සහ ණය කළඹේ අවදානම විචක්ෂණශීලී ලෙස කළමනාකරණය කිරීම මැදි කාලීන ණය කළමනාකරණ උපායමාර්ගය තුළින් ප්‍රධාන වශයෙන් අවධානය යොමු කෙරේ. ණය ගතික දර්ශක 2018 වසරේ පැවති පාදක දර්ශක සමග සසඳන විට 2020 වසරේ ප්‍රගතියක් වාර්තා කර ඇත. 2020 අගෝස්තු අවසානය වන විට, සමස්ත ණයෙහි ප්‍රතිශතයක් ලෙස විදේශ මුදලින් නාමනය කළ ණය ප්‍රමාණය පාදක වර්ෂයේ පැවති සියයට 54.0 සිට 50.8 දක්වා අඩු වී ඇති අතර, විදේශ මුදලින් නාමනය කළ ණය කළඹේ කල්පිරීමේ සාමාන්‍ය කාලය පාදක වර්ෂයේ පැවති වසර 6.6 සිට වසර 7.3 දක්වා 2020 අගෝස්තු මස අවසන් වන විට ඉහළ ගොස් ඇත. කෙසේ වෙතත්, පාදක වර්ෂයේ පැවති සියයට 16.4ක සමස්ත ණයෙහි ප්‍රතිශතයක් ලෙස වූ කෙටි කාලීන ණය කල්පිරීම සියයට 18.6 දක්වා 2020 අගෝස්තු මස අවසන් වන විට ඉහළ ගොස් තිබේ.


## රජයේ අයවැය කටයුතු

### ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂ

- **2020 වසරේ ජනවාරි සිට ජූලි දක්වා කාලපරිච්ඡේදය තුළ දී ආදායම් රැස් කිරීම අඩු මට්ටමක පැවතීම හා පුනරාවර්තන වියදම් වැඩි වීම ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂවලට සැලකිය යුතු ලෙස බලපාන ලදී.** 2020 වසරේ ජනවාරි සිට ජූලි දක්වා කාලපරිච්ඡේදය තුළ දී, සමස්ත අයවැය හිඟය, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස පැවති සියයට 4.6ක (රුපියල් බිලියන 684.1) සිට ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි[3] ප්‍රතිශතයක් ලෙස සියයට 5.6ක් (රුපියල් බිලියන 872.6) දක්වා වැඩි විය. සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී, ප්‍රාථමික ශේෂය 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස වාර්තා කළ සියයට 0.8ක (රුපියල් බිලියන 122.5) සිට ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 1.9ක් (රුපියල් බිලියන 288.9ක්) දක්වා වැඩි විය. රජයේ නිර්-ඉතුරුම් පිළිබිඹු කෙරෙන වර්තන ගිණුමේ හිඟය 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 2.1ක (රුපියල් බිලියන 311.8) සිට ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2020 වසරේ ජනවාරි සිට ජූලි දක්වා කාලපරිච්ඡේදය තුළ දී සියයට 4.5ක් (රුපියල් බිලියන 694.5ක්) දක්වා වැඩි විය.

**6.2 රූප සටහන**

**ප්‍රධාන රාජ්‍ය මූල්‍ය දර්ශක (අ)**




මූලයන්: මුදල් අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) 2020 දත්ත මහ බැංකුවේ ද.දේ.නි. පුරෝකථන මත පදනම් වේ

6

3 ශ්‍රී ලංකා මහ බැංකුවේ ද.දේ.නි පුරෝකථන මත පදනම් වේ.

## රජයේ ආදායම සහ ප්‍රදාන

### ආදායම

- **බදු ආදායම සැලකිය යුතු ලෙස පහළ යෑම හේතුවෙන්, 2020 වසරේ ජනවාරි සිට ජූලි දක්වා කාලපරිච්ඡේදය තුළ දී රජයේ ආදායම, 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස පැවති සියයට 6.9ක සිට ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 4.9ක් දක්වා අඩු විය.** ආර්ථික ක්‍රියාකාරකම් උත්තේජනය කිරීම සඳහා ජනාධිපතිවරණයෙන් පසුව ලබාදුන් බදු සහන මධ්‍යයේ, කොවිඩ්-19 වසංගතය පැතිරීම හේතුවෙන් ආර්ථික ක්‍රියාකාරකම් අඩු වීම, රජයේ ආදායම විශාල ලෙස පහළ යෑමට හේතු විය. නාමික වශයෙන්, රජයේ ආදායම, 2020 වසරේ ජූලි මාසයෙන් අවසන් වන මාස හත තුළ දී, 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ වාර්තා වූ රුපියල් බිලියන 1,031.9ක සිට රුපියල් බිලියන 763.2ක් දක්වා සියයට 26.0කින් අඩු විය. රාජ්‍ය ආදායමෙහි මෙම පහළ යෑම, ආදායම් බදු, නිෂ්පාදන බදු/සුරා බදු, එකතු කළ අගය මත බද්ද, ජාතිය ගොඩනැගීමේ බද්ද, වරාය හා ගුවන්තොටුපළ සංවර්ධන බද්ද සහ සෙස් බද්ද වැනි ප්‍රධාන බදු කාණ්ඩ තුළින් පිළිබිඹු විය. කෙසේ වුව ද, 2019 වසරේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, රුපියල් බිලියන 24.0ක් වූ මහ බැංකුව මගින් රජය වෙත ප්‍රදානය කළ ලාභ පැවරුම් හේතුවෙන් සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී බදු නොවන ආදායම රුපියල් බිලියන 92.8ක් දක්වා සියයට 6.1කින් වැඩි විය.

- **2020 වසරේ ජනවාරි සිට ජූලි දක්වා කාලපරිච්ඡේදය තුළ දී ආදායම් බදු මගින් ලද ආදායම 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී රුපියල් බිලියන 126.0ක් දක්වා සියයට 31.9කින් සැලකිය යුතු ලෙස අඩු විය.** 2020 වසරේ ජූලි මාසයෙන් අවසන් වන මාස හත තුළ දී, ආදායම් බදු මගින් ලද ආදායම 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස වාර්තා වූ සියයට 1.2ක සිට ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 0.8ක් දක්වා පහළ ගියේය. 2020 ජනවාරි මස සිට බලපැවැත්වෙන පරිදි උපයන විට ගෙවීමේ බද්ද සහ ආර්ථික සේවා ගාස්තුව අහෝසි කිරීම, 2020 වසරේ ජනවාරි සිට ජූලි දක්වා කාලපරිච්ඡේදය තුළ දී ආදායම් බදු අඩු වීමට ප්‍රධාන වශයෙන් හේතු විය. ඒ අනුව, උපයන විට ගෙවීමේ බද්ද වෙනුවට 2020 අප්‍රේල් 01 දින සිට හඳුන්වා දෙන ලද 'අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද' මගින් ලද ආදායම ද ඇතුළුව, 2019 මූල්‍ය වර්ෂය සඳහා අදාළ 2020 වසර තුළ දී එක්රැස් කරන ලද උපයන විට ගෙවීමේ බද්දෙන් ලද ආදායම, 2020 වසරේ ජනවාරි සිට ජූලි දක්වා කාලපරිච්ඡේදය තුළ දී රුපියල් බිලියන 9.1ක් විය. ඒ හා සැසඳීමේ දී, 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී උපයන විට ගෙවීමේ බද්ද මගින් එකතු කරන ලද බදු ආදායම රුපියල් බිලියන 29.7ක අගයක් වාර්තා කළේය. 2019 මූල්‍ය වර්ෂය සඳහා 2020 වසර තුළ දී එක්රැස් කරන ලද ආර්ථික සේවා ගාස්තු මගින් ලද ආදායම, 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ රුපියල් බිලියන 40.1 හා සැසඳීමේ දී 2020 වසරේ ජනවාරි සිට ජූලි දක්වා කාලපරිච්ඡේදය තුළ දී රුපියල් බිලියන 13.6ක් ලෙස වාර්තා විය. රඳවා ගැනීමේ බදු සඳහා කළ සංශෝධනයත් සමඟ සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී රඳවා ගැනීමේ බදු මගින් ලද ආදායම, රුපියල් බිලියන 6.5ක් දක්වා සියයට 77.8කින් නාමික වශයෙන් පහළ ගියේය. කෙසේ වුව ද, පෙර මූල්‍ය වර්ෂයට අදාළ අවසන් බදු ගෙවීමේ බලපෑම පිළිබිඹු කරමින්, 2020 වසරේ ජූලි මාසයෙන් අවසන් වන මාස හත තුළ දී, සංස්ථාපිත හා සංස්ථාපිත නොවන ආදායම් බදු මගින් ලද ආදායම 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ වාර්තා වූ රුපියල් බිලියන 85.7ක සිට රුපියල් බිලියන 96.7ක් දක්වා වැඩි විය.

- **2020 වසරේ ජනවාරි සිට ජූලි දක්වා කාලපරිච්ඡේදය තුළ දී, එකතු කළ අගය මත බදු ආදායම නාමික වශයෙන් මෙන්ම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ද අඩු වූ අතර, කොවිඩ්-19 වසංගතය තුළින් ඇති වූ ආර්ථික පසුබෑම සහ 2019 වසරේ අග භාගයේ දී එකතු කළ අගය මත බද්දට සිදු කළ සංශෝධන මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.** 2020 වසරේ ජූලි මාසයෙන්

**6.1 සංඛ්‍යා සටහන**

**ආර්ථික වර්ගීකරණය අනුව රාජ්‍ය ආදායම**

රු. බිලියන

| අයිතමය | 2018 | 2019 (අ) | 2019 ජන-ජූලි (අ) | 2020 ජන-ජූලි (අ) |
|---|---|---|---|---|
| බදු ආදායම | **1,712.3** | **1,734.9** | **944.4** | **670.4** |
| ආදායම් බදු | 310.4 | 427.7 | 184.9 | 126.0 |
| එකතුකළ අගය මත බදු | 461.7 | 443.9 | 265.6 | 119.3 |
| නිෂ්පාදන බදු | 484.3 | 399.5 | 225.8 | 184.9 |
| ආනයන මත බදු | 97.0 | 98.4 | 55.2 | 60.4 |
| වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්ද | 113.9 | 112.2 | 64.5 | 62.4 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 71.4 | 70.7 | 42.2 | 1.8 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද | 75.8 | 70.4 | 42.2 | 46.5 |
| සෙස් බද්ද | 53.4 | 50.7 | 28.3 | 28.1 |
| අනෙකුත් | 44.4 | 61.5 | 35.7 | 41.0 |
| බදු නොවන ආදායම | **207.7** | **156.0** | **87.5** | **92.8** |
| මුළු ආදායම | **1,920.0** | **1,890.9** | **1,031.9** | **763.2** |

(අ) තාවකාලික


මූලය: මුදල් අමාත්‍යාංශය

අවසන් වන මාස හත තුළ දී, එකතු කළ අගය මත බදු ආදායම, රුපියල් බිලියන 119.3ක් දක්වා සියයට 55.1කින් අඩු වූ අතර, එය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති සියයට 1.8ක සිට ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 0.8ක් දක්වා අඩු විය. දේශීය ආර්ථික කටයුතු තුළින් රැස්කර ගනු ලැබූ එකතු කළ අගය මත බදු ආදායම 2020 වසරේ ජනවාරි සිට ජූලි දක්වා කාලපරිච්ඡේදය තුළ දී රුපියල් බිලියන 74.7 දක්වා සියයට 54.9කින් අඩු වූ අතර, ආනයන ආශ්‍රිත කටයුතු තුළින් රැස්කර ගනු ලැබූ එකතු කළ අගය මත බදු ආදායම 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ රුපියල් බිලියන 100.0 සිට රුපියල් බිලියන 44.7ක් දක්වා සියයට 55.3කින් අඩු විය. 2020 වසරේ ජනවාරි සිට ජූලි දක්වා කාලපරිච්ඡේදය තුළ දී, එකතු කළ අගය මත බදු ආදායම මුළු බදු ආදායමේ ප්‍රතිශතයක් ලෙස 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති සියයට 28.1ක සිට සියයට 17.8ක් දක්වා පහළ ගියේය. එමෙන්ම, 2020 වසරේ ජනවාරි සිට ජූලි දක්වා කාලපරිච්ඡේදය තුළ එකතු කළ අගය මත බදු ආදායම මුළු ආදායම වෙත දක්වන දායකත්වය 2019 වසරේ ජනවාරි සිට ජූලි දක්වා කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ සියයට 25.7ක සිට සියයට 15.6ක් දක්වා අඩු විය.

- **ප්‍රධාන වශයෙන් මෝටර් වාහන, මත්පැන්, දුම්වැටි හා ඛනිජ තෙල් නිෂ්පාදන මත අය කෙරෙන නිෂ්පාදන/සුරා බදු ආදායම පහළ යෑම හේතුවෙන් සමස්ත නිෂ්පාදන/සුරා බදු ආදායම නාමික වශයෙන් මෙන් ම ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ද සැලකිය යුතු ලෙස අඩු විය.** 2020 වසරේ ජනවාරි සිට ජූලි දක්වා කාලපරිච්ඡේදයේ දී නිෂ්පාදන/සුරා බදු ආදායම රුපියල් බිලියන 184.9ක් දක්වා සියයට 18.1කින් අඩු වූ අතර, එය 2019 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස වාර්තා වූ සියයට 1.5ක සිට ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 1.2ක් දක්වා අඩු විය. විදේශීය අංශය කෙරෙහි වන පීඩනය අවම කිරීමේ අරමුණින් යුතුව මෝටර් වාහන ආනයනය සීමා කිරීම සඳහා ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගයන් හි බලපෑම පිළිබිඹු කරමින්, 2020 වසරේ ජනවාරි සිට ජූලි දක්වා කාලපරිච්ඡේදය තුළ දී මෝටර් වාහන මත වන නිෂ්පාදන බදු අදායම රුපියල් බිලියන 42.7ක් දක්වා සියයට 39.8 කින් සැලකිය යුතු ලෙස අඩු විය. මේ අතර, 2020 වසරේ ජනවාරි සිට ජූලි දක්වා කාලපරිච්ඡේදය තුළ දී, ඛනිජ තෙල් නිෂ්පාදන මත වූ නිෂ්පාදන බදු ආදායම 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති රුපියල් බිලියන 35.3ක සිට රුපියල් බිලියන 31.2ක් දක්වා අඩු වූ අතර, ඛනිජ තෙල් නිෂ්පාදන ආනයන අඩු වීම මෙයට හේතු විය. මීට අමතරව, 2020 වසරේ ජනවාරි සිට ජූලි දක්වා කාලපරිච්ඡේදය තුළ දී, මත්පැන් මත වූ සුරා බදු ආදායම 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති රුපියල් බිලියන 66.2ක සිට රුපියල් බිලියන 60.1ක් දක්වා අඩු විය. මේ අතර, දුම්කොළ හා දුම්වැටි මත වන නිෂ්පාදන බදු ආදායම 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව රුපියල් බිලියන 48.3ක් දක්වා සියයට 5.3කින් අඩු විය.

- **2020 ජනවාරි සිට ජූලි දක්වා කාලපරිච්ඡේදය තුළ දී, ආනයන ආශ්‍රිත බදු කිහිපයකින් ලද ආදායම, නාමික වශයෙන් ගත් කළ, 2019 සමාන කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී අඩු වූ අතර, විනිමය අනුපාතය සහ ගෙවුම් ශේෂය මත ඇති වන පීඩනය අවම කිරීම අරමුණු කර ගනිමින් අත්‍යවශ්‍ය නොවන ආනයන අඩු කිරීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය.** ආනයන හා සම්බන්ධ නිෂ්පාදන බදු මගින් ලද ආදායම පහළ යෑමට අමතරව 2020 වසරේ ජනවාරි සිට ජූලි දක්වා කාලපරිච්ඡේදය තුළ දී, වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු ආදායම 2019 වසරේ සමාන කාලපරිච්ඡේදයේ වාර්තා වූ රුපියල් බිලියන 64.5ක සිට රුපියල් බිලියන 62.4ක් දක්වා සියයට 3.2කින් අඩු විය. තව ද, 2020 ජූලි මාසයෙන් අවසන් වන මාස හත තුළ දී, සෙස් බදු ආදායම ද 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ රුපියල් බිලියන 28.3ක සිට රුපියල් බිලියන 28.1ක් දක්වා සුළු වශයෙන් අඩු විය. කෙසේ වුව ද, සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී ආනයන බදු ආදායම රුපියල් බිලියන 55.2ක සිට රුපියල් බිලියන 60.4ක් දක්වා වැඩි වූ අතර, පෙට්‍රල් සහ ඩීසල් ආනයනය මත වන බදු වැඩි කිරීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. විශේෂ වෙළඳ භාණ්ඩ බදු ආදායම 2020 වසරේ ජනවාරි සිට ජූලි දක්වා කාලපරිච්ඡේදය තුළ දී, 2019 වසරේ සමාන කාලපරිච්ඡේදයේ වාර්තා වූ රුපියල් බිලියන 42.2ක සිට රුපියල් බිලියන 46.5ක් දක්වා වැඩි වූ අතර, තෝරාගත් භාණ්ඩ ආනයනය මත වන විශේෂ වෙළඳ භාණ්ඩ බදු ඉහළ නැංවීම සඳහා සිදු කරන ලද සංශෝධන මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. 2019 වසරේ දෙසැම්බර් මාසයේ දී අහෝසි කරන ලද ජාතිය ගොඩනැගීමේ බද්දට අදාළව 2020 ජූලි මාසයෙන් අවසන් වන මාස හත තුළ දී රුපියල් බිලියන 1.8ක ආදායමක් වාර්තා විය. මේ සඳහා, 2019 වසර සඳහා

**6.3 රූප සටහන**
**රාජ්‍ය ආදායමේ සංයුතිය**




එකතු කරන ලද සහ 2020 වසරේ දී ප්‍රේෂණය වූ ආදායම් රැස් කිරීම් හේතු විය.

- **බදු නොවන ආදායම 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී 2020 වසරේ ජනවාරි සිට ජූලි දක්වා කාලපරිච්ඡේදය තුළ දී, නාමික වශයෙන් වැඩි වූ අතර, ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස එය නොවෙනස්ව පැවතුණි.** 2019 වසරේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, රුපියල් බිලියන 24.0ක් වූ මහ බැංකුව මගින් රජය වෙත ප්‍රදානය කළ ලාභ පැවරුම් ප්‍රධාන වශයෙන් හේතු වීම නිසා බදු නොවන ආදායම, 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ රුපියල් බිලියන 87.5ක සිට රුපියල් බිලියන 92.8ක් දක්වා ඉහළ ගියේය. මීට අමතරව, සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී, කුලී සහ පොලී ආදායම රුපියල් බිලියන 13.5ක් දක්වා සියයට 33.7කින් ඉහළ ගිය අතර, සමාජ ආරක්ෂණ දායක මුදල්වලින් ලද ආදායම රුපියල් බිලියන 17.7ක් දක්වා සියයට 9.2කින් ඉහළ ගියේය. කෙසේ වෙතත්, ගාස්තු හා අයකිරීම් සහ ලාභ හා ලාභාංශ පැවරුම්, පිළිවෙළින්, රුපියල් බිලියන 29.6ක් දක්වා සියයට 36.3කින් සහ රුපියල් බිලියන 5.1ක් දක්වා සියයට 57.8කින් අඩු විය.

## ප්‍රදාන

- **පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී, 2020 වසරේ ජනවාරි සිට ජූලි දක්වා කාලපරිච්ඡේදය තුළ දී, විදේශීය ප්‍රදාන ඉහළ ගිය අතර, කොවිඩ්-19 ආශ්‍රිත ආධාරවල බලපෑම මෙමගින් ප්‍රධාන වශයෙන් පිළිබිඹු විය.** ඒ අනුව, 2020 වසරේ ජූලි මාසයෙන් අවසන් වන මාස හත තුළ දී, විදේශීය ප්‍රදාන 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ වාර්තා වූ රුපියල් බිලියන 1.1ට සාපේක්ෂව රුපියල් බිලියන 2.1ක් විය.

## රජයේ වියදම් හා ශුද්ධ ණය දීම්

- **පුනරාවර්තන වියදම් ඉහළ ගිය ද, ප්‍රාග්ධන වියදම් විශාල ලෙස අඩු වීම හේතුවෙන් 2020 වසරේ ජනවාරි සිට ජූලි දක්වා කාලපරිච්ඡේදය තුළ දී, රජයේ වියදම සහ ශුද්ධ ණය දීම් 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස පැවති සියයට 11.4ක සිට ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 10.6ක් දක්වා අඩු විය.** 2020 වසරේ ජූලි මාසයෙන් අවසන් වූ මාස හත තුළ රජයේ වියදම් සහ ශුද්ධ ණය දීම් 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති රුපියල් බිලියන 1,717.1ක සිට රුපියල් බිලියන 1,637.9ක් දක්වා අඩු විය.

- **2020 වසරේ ජූලි මාසයෙන් අවසන් වන මාස හත තුළ, පුනරාවර්තන වියදම් 2019 වසරේ සමාන කාලපරිච්ඡේදයේ ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස වාර්තා වූ සියයට 8.9ක සිට ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 9.4ක් දක්වා වැඩි වූ අතර, වැටුප් හා වේතන සහ සහනාධාර හා වර්තන පැවරුම් ඉහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.** නාමික වශයෙන් ගත් කළ, 2020 වසරේ ජනවාරි සිට ජූලි දක්වා කාලපරිච්ඡේදය තුළ දී පුනරාවර්තන වියදම 2019 වසරේ සමාන කාලපරිච්ඡේදයේ වාර්තා වූ රුපියල් බිලියන 1,343.7ට සාපේක්ෂව රුපියල් බිලියන 1,457.7ක් දක්වා සියයට 8.5කින් වැඩි විය. 2020 වසරේ ජනවාරි සිට ජූලි දක්වා කාලපරිච්ඡේදය තුළ දී පොලී ගෙවීම් සඳහා වූ වියදම රුපියල් බිලියන 583.6ක් දක්වා සියයට 3.9කින් වැඩි වූ

**6.2 සංඛ්‍යා සටහන**

**ආර්ථික වර්ගීකරණය අනුව වියදම**

රු. බිලියන

| අයිතමය | 2018 | 2019 (අ) | 2019 ජන-ජූලි (අ) | 2020 ජන-ජූලි (අ) |
|---|---|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | **2,089.7** | **2,301.2** | **1,343.7** | **1,457.7** |
| එයින්, වැටුප් හා වේතන | 626.0 | 686.5 | 388.2 | 451.4 |
| පොලී ගෙවීම් | 852.2 | 901.4 | 561.6 | 583.6 |
| විදේශීය | 212.7 | 248.6 | 154.2 | 170.8 |
| දේශීය | 639.5 | 652.8 | 407.4 | 412.8 |
| සමෘද්ධි දීමනා | 39.2 | 44.7 | 22.7 | 30.7 |
| විශ්‍රාම වැටුප් | 194.5 | 227.7 | 124.3 | 140.7 |
| පොහොර සහනාධාර | 26.9 | 35.0 | 25.3 | 18.6 |
| **ප්‍රාග්ධන වියදම හා ශුද්ධ ණය දීම්** | **603.5** | **614.1** | **373.4** | **180.2** |
| **මුළු වියදම හා ශුද්ධ ණය දීම්** | **2,693.2** | **2,915.3** | **1,717.1** | **1,637.9** |


(අ) තාවකාලික

මූලය: මුදල් අමාත්‍යාංශය

අතර, සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී විදේශීය ණය සඳහා වන පොලී ගෙවීම් සියයට 10.8කින් වැඩි වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. ඒ අනුව, 2020 වසරේ ජනවාරි සිට ජූලි දක්වා කාලය තුළ පැවැති නොපියවූ වාණිජ ණයවල වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවීම නිසා 2020 වසරේ ජූලි මාසයෙන් අවසන් වූ මාස හත තුළ දී විදේශීය ණය මත වන පොලී ගෙවීම් 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති රුපියල් බිලියන 154.2ක සිට රුපියල් බිලියන 170.8ක් දක්වා වැඩි විය. 2020 වසරේ ජනවාරි සිට ජූලි දක්වා කාලපරිච්ඡේදය තුළ දී දේශීය ණය මත වන පොලී ගෙවීම්, 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ වාර්තා වූ රුපියල් බිලියන 407.4ක සිට රුපියල් බිලියන 412.8ක් දක්වා වැඩි වූ අතර, 2020 වසර ආරම්භයේ සිට රජයේ සුරැකුම්පත් මත වන පොලී අනුපාත පහත යෑම හේතුවෙන් ණය ගැනීමේ පිරිවැය අඩු වී තිබියදීත්, 2020 වසරේ ජූලි මස අග වන විට නොපියවූ දේශීය ණය තොගය සියයට 16.3කින් ඉහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. 2020 වසරේ ජනවාරි සිට ජූලි දක්වා කාලපරිච්ඡේදය තුළ දී පොලී ගෙවීම් 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ වාර්තා වූ ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 3.7ක සිට ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 3.8ක් දක්වා වැඩි විය. 2020 වසරේ ජනවාරි සිට ජූලි දක්වා කාලපරිච්ඡේදය තුළ දී වැටුප් හා වේතන සඳහා වූ වියදම, 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති රුපියල් බිලියන 388.2ට සාපේක්ෂව රුපියල් බිලියන 451.4ක් දක්වා ඉහළ ගිය අතර, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2019 යටතේ, 2019 වසරේ ජූලි මස සිට බලපැවැත්වෙන පරිදි රාජ්‍ය සේවකයින්ට රුපියල් 2,500ක අතුරු දීමනාවක් ලබා දීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. තව ද, 2020 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 යටතේ, රාජ්‍ය අංශයේ වැටුප් ගැලපීම සම්පූර්ණ වීම ද සලකා බලන කාලපරිච්ඡේදය තුළ වැටුප් හා වේතන වැඩි කිරීමට දායක විය. 2020 වසරේ ජූලි මාසයෙන් අවසන් වන මාස හත තුළ දී, සහනාධාර සහ වර්තන පැවරුම් සඳහා වූ වියදම, රුපියල් බිලියන 340.1ක් දක්වා සියයට 8.7කින් නාමික වශයෙන්, වැඩි වූ අතර, එය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 2.1ක සිට ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 2.2ක් දක්වා වැඩිවීමකි. විශ්‍රාම වැටුප් සහ සමෘද්ධි ගෙවීම් සඳහා වූ වියදම් ඉහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. ඒ අනුව, විශ්‍රාම වැටුප් සඳහා වන වියදම 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති රුපියල් බිලියන 124.3ට සාපේක්ෂව 2020 වසරේ ජනවාරි සිට ජූලි දක්වා කාලපරිච්ඡේදය තුළ දී රුපියල් බිලියන 140.7ක් දක්වා වැඩි වූ අතර, 2019 වසරේ ජූලි මස සිට බලපැවැත්වෙන

**6.4 රූප සටහන**

**රාජ්‍ය වියදමේ සංයුතිය**




මූලයන්: මුදල් අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

පරිදි විශ්‍රාම වැටුප් විෂමතා නිවැරදි කිරීම මෙමගින් ප්‍රධාන වශයෙන් පිළිබිඹු විය. 2020 වසරේ ජූලි මාසයෙන් අවසන් වන මාස හත තුළ දී සමෘද්ධි වැඩසටහන සඳහා වන වියදම 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ වාර්තා වූ රුපියල් බිලියන 22.7ක සිට රුපියල් බිලියන 30.7ක් දක්වා වැඩි විය. කෙසේ වුව ද, සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී පොහොර සහනාධාරය සඳහා වන වියදම රුපියල් බිලියන 18.6ක් දක්වා සියයට 26.5කින් අඩු වූ අතර, පොහොර ආශ්‍රිත වියදම් සඳහා කාලීන ණය පහසුකමක් ලබා ගැනීම නිසා වියදම් වාර්තා කිරීමේ දී සිදු වන ප්‍රමාදය, මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.

- **2020 වසරේ ජනවාරි සිට ජූලි දක්වා කාලපරිච්ඡේදය තුළ දී ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම් නාමික වශයෙන් මෙන් ම ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ද විශාල ලෙස අඩු විය.** 2019 වසරේ සිට ඉදිරියට ගෙන ආ නොගෙවූ බිල්පත් විශාල ප්‍රමාණයක් පැවතීම හේතුවෙන් ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම් ප්‍රමුඛතා අනුව පෙළ ගැස්වීම සහ අතුරු සම්මත ගිණුම යටතේ නව ප්‍රාග්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. ඒ අනුව, 2020 වසරේ ජූලි මාසයෙන් අවසන් වන මාස හත තුළ දී ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම්, නාමික වශයෙන්, 2019 වසරේ සමාන කාලපරිච්ඡේදයේ වාර්තා වූ රුපියල් බිලියන 373.4ට සාපේක්ෂව රුපියල් බිලියන 180.2ක් දක්වා සියයට 51.7කින් අඩු විය. එමෙන්ම, මෙම වසරේ සලකා බලන කාලය තුළ රජය විසින් කොවිඩ්-19 වසංගතය වෙනුවෙන් විශාල වියදමක් දරා ඇත.



## අයවැය හිඟය මූල්‍යනය කිරීම

- **2020 වසරේ ජනවාරි සිට ජූලි දක්වා කාලපරිච්ඡේදයේ දී අයවැය හිඟය දේශීය මූලාශ්‍ර මගින් මූල්‍යනය කළ අතර, විදේශීය මූලාශ්‍ර ශුද්ධ ණය ආපසු ගෙවීමක් වාර්තා කළේය.** සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී ශුද්ධ දේශීය මූල්‍යනය, 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදය දී වාර්තා වූ රුපියල් බිලියන 571.4ට සාපේක්ෂව රුපියල් බිලියන 1,067.0ක් විය. සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී විදේශීය මූලාශ්‍ර මගින් සිදු කළ මූල්‍යනය, 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ රුපියල් බිලියන 112.7ක ශුද්ධ මූල්‍යනයට සාපේක්ෂව රුපියල් බිලියන 194.5ක ශුද්ධ ණය ආපසු ගෙවීමක් ලෙස වාර්තා විය.

- **2020 වසරේ ජූලි මාසයෙන් අවසන්වන මාස හත තුළ දී මහ බැංකුව මගින් සිදු කළ සැලකිය යුතු තරම් විශාල මූල්‍යනය ද ඇතුළුව 2019 වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව බැංකු අංශයෙන් සිදු කළ මූල්‍යනය වැඩි වීම හේතුවෙන්, දේශීය මූල්‍යනය ඉහළ ගියේය.** ඒ අනුව, 2020 ජූලි මාසයෙන් අවසන් වන මාස හත තුළ දී බැංකු අංශයෙන් සිදු කළ ශුද්ධ මූල්‍යනය, 2019 වසරේ සමාන කාලපරිච්ඡේදයේ පැවති රුපියල් බිලියන 170.9ක සිට රුපියල් බිලියන 867.0ක් දක්වා සැලකිය යුතු ලෙස වැඩි විය. මහ බැංකුව භාණ්ඩාගාර බිල්පත් මගින් සිදු කළ ශුද්ධ මූල්‍යනය, 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ වාර්තා වූ රුපියල් බිලියන 165.4ක ශුද්ධ ණය ආපසු ගෙවීමට සාපේක්ෂව රුපියල් බිලියන 186.0ක ශුද්ධ මූල්‍යනය ඒ සඳහා හේතු විය. මේ අතර, 2020 වසරේ ජූලි මාසයෙන් අවසන් වන මාස හත තුළ දී භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර මගින් වාණිජ බැංකු සිදු කළ ශුද්ධ මූල්‍යනය, 2019 වසරේ සමාන කාලපරිච්ඡේදයේ වාර්තා වූ රුපියල් බිලියන 341.1ක සිට රුපියල් බිලියන 436.6ක් දක්වා වැඩි විය. සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී බැංකු නොවන අංශයෙන් සිදු කළ ශුද්ධ දේශීය මූල්‍යනය 2019 වසරේ සමාන කාලපරිච්ඡේදයේ වාර්තා වූ රුපියල් බිලියන 400.5ක සිට රුපියල් බිලියන 200.0ක් දක්වා අඩු වූ අතර, එය සමස්ත දේශීය මූල්‍යනයෙන් සියයට 18.7ක් විය.

- **2020 වසරේ ජනවාරි සිට ජූලි දක්වා කාලපරිච්ඡේදයේ දී භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර නිකුතු දේශීය මූල්‍යනයේ ප්‍රධාන මූලාශ්‍ර ලෙස අඛණ්ඩව පැවතුණි.** 2020 වසරේ ජූලි මාසයෙන් අවසන් වන මාස හත තුළ දී භාණ්ඩාගාර බිල්පත් මගින් සිදු කළ ශුද්ධ මූල්‍යනය පෙර වසරේ සමාන කාලපරිච්ඡේදයේ පැවති රුපියල්

**6.3 සංඛ්‍යා සටහන**

**අයවැය හිඟය මූල්‍යනයේ මූලාශ්‍ර**


රු. බිලියන

| අයිතමය | 2018 | 2019 (අ) | 2019 ජන-ජූලි (අ) | 2020 ජන-ජූලි (අ) |
|---|---|---|---|---|
| **දේශීය මූල්‍යනය** | **437.2** | **702.4** | **571.4** | **1,067.0** |
| බැංකු | 109.5 | 193.1 | 170.9 | 867.0 |
| බැංකු නොවන | 327.8 | 509.3 | 400.5 | 200.0 |
| **විදේශීය මූල්‍යනය** | **323.5** | **314.1** | **112.7** | **-194.5** |
| ව්‍යාපෘති සහ වැඩසටහන් ණය | 7.7 | -15.2 | -5.4 | -140.3 |
| වාණිජ ණය | 456.9 | 377.9 | 136.2 | 29.2 |
| භාණ්ඩාගාර බැඳුම්කරවල විදේශීය ආයෝජන | -126.4 | - 59.3 | -18.3 | -63.4 |
| භාණ්ඩාගාර බිල්පත්වල විදේශීය ආයෝජන | -14.6 | 10.6 | 0.2 | -20.0 |
| **සමස්ත මූල්‍යනය** | **760.8** | **1,016.5** | **684.1** | **872.6** |

(අ) තාවකාලික

මූලයන්: මුදල් අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

**6.5 රූප සටහන**
**අයවැය හිඟය මූල්‍යනය (අ)**




මූලයන්: මුදල් අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) 2020 දත්ත මහ බැංකුවේ ද.දේ.නි. පුරෝකථන මත පදනම් වේ

බිලියන 149.9ක සිට රුපියල් බිලියන 276.9ක් දක්වා වැඩි විය. මේ අතර, අදාළ කාලපරිච්ඡේදය තුළ දී, භාණ්ඩාගාර බැඳුම්කර මගින් සිදු කළ ශුද්ධ මූල්‍යනය 2019 වසරේ සමාන කාලපරිච්ඡේදයේ පැවති රුපියල් බිලියන 331.8ක සිට රුපියල් බිලියන 536.1ක් දක්වා වැඩි විය. 2020 වසරේ ජූලි මාසයෙන් අවසන් වන මාස හත තුළ දී, රජයේ වාණිජ බැංකු අයිරා මගින් සිදු කළ මූල්‍යනය, පෙර වසරේ සමාන කාලපරිච්ඡේදයේ පැවති රුපියල් බිලියන 64.2ක ශුද්ධ ණය ආපසු ගෙවීමට සාපේක්ෂව රුපියල් බිලියන 296.7ක ශුද්ධ ණය ගැනීමක් ලෙස වාර්තා විය. සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මගින් ලබා ගත් ණය ප්‍රමාණය 2019 වසරේ ජූලි මාසයෙන් අවසන් වන මාස හත තුළ දී පැවති රුපියල් බිලියන 47.2ක ශුද්ධ ණය ආපසු ගෙවීමට සාපේක්ෂව රුපියල් බිලියන 99.7ක ශුද්ධ ණය ආපසු ගෙවීමක් ලෙස වාර්තා විය. අදාළ කාල සීමාව තුළ දී බැංකු අංශය මුහුණ දුන් විදේශ මුදල් ද්‍රවශීලතා දුෂ්කරතාවයන්, ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල මෙම ශුද්ධ ණය ආපසු ගෙවීම සඳහා හේතු විය.

- **2020 වසරේ ජූලි මාසයෙන් අවසන් වන මාස හත තුළ දී විදේශ ව්‍යාපෘති ණය සහ භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කරවල සිදු කළ අනේවාසික විදේශීය ආයෝජන යනාදියෙහි ණය ආපසු ගෙවීම් පිළිබිඹු කරමින් සමස්ත විදේශීය මූල්‍යනය ශුද්ධ ණය ආපසු ගෙවීමක් ලෙස වාර්තා විය.** සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී අයවැය හිඟය මූල්‍යනයට අදාළ ශුද්ධ විදේශීය ණය ගැනීම් 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති රුපියල් බිලියන 112.7ක ශුද්ධ ණය ගැනීමට සාපේක්ෂව රුපියල් බිලියන 194.5ක ශුද්ධ ණය ආපසු ගෙවීමක් ලෙස වාර්තා විය. ශුද්ධ විදේශීය මූල්‍යනය රුපියල් බිලියන 140.3ක විදේශ ව්‍යාපෘති ණය ආපසු ගෙවීම, රුපියල් බිලියන 83.3ක භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කරවල විදේශ ආයෝජනයන්හි ශුද්ධ ණය ආපසු ගෙවීම, සහ රුපියල් බිලියන 29.2ක විදේශ මුදල් කාලීන මූල්‍ය පහසුකම යටතේ ණය ලබා ගැනීම යනාදියෙන් සමන්විත වේ.

## රාජ්‍ය ණය සහ ණය සේවාකරණ ගෙවීම්

### රාජ්‍ය ණය

- **2020 වසරේ ජූලි මස අග වන විට මධ්‍යම රජයේ මුළු ණය ප්‍රමාණය, 2019 වසරේ අවසානයට පැවති රුපියල් බිලියන 13,031.5ක සිට රුපියල් බිලියන 14,261.0ක් දක්වා රුපියල් බිලියන 1,229.5කින් වැඩි විය.** 2019 වසර අවසානයට සාපේක්ෂව, 2020 වසරේ ජූලි මස අග වන විට දේශීය ණය ප්‍රමාණය රුපියල් බිලියන 7,708.0ක් දක්වා රුපියල් බිලියන 1,078.9කින් වැඩි වූ අතර, විදේශීය ණය ප්‍රමාණය රුපියල් බිලියන 6,553.1ක් දක්වා රුපියල් බිලියන 150.6කින් වැඩි විය. අයවැය හිඟය පුළුල් වීම හේතුවෙන් ශුද්ධ මූල්‍යනයේ වැඩි වීම 2020 වසරේ ජූලි මස අග වන විට මධ්‍යම රජයේ ණය වැඩිවීමට සැලකිය යුතු ලෙස දායක විය. මේ අතර, 2020 ජූලි මස අග වන විට විනිමය අනුපාතය අවප්‍රමාණය වීම ද නොපියවූ ණය ප්‍රමාණයේ රුපියල් වටිනාකම රුපියල් බිලියන 281.2කින් වැඩිවීමට හේතු විය.

- **2019 වසරේ අග පැවති තත්ත්වයට සාපේක්ෂව 2020 වසරේ ජූලි මස අග වන විට මධ්‍යම රජයේ සමස්ත ණය ප්‍රමාණයෙන් කෙටි කාලීන දේශීය ණය ප්‍රමාණය වැඩි වූ අතර, මැදි හා දිගු කාලීන ණය ප්‍රමාණය සුළු වශයෙන් අඩු විය.** ඒ අනුව, සමස්ත දේශීය ණය ප්‍රමාණයෙහි ප්‍රතිශතයක් ලෙස කෙටි කාලීන ණය ප්‍රමාණය 2020 ජූලි මස අග වන විට සියයට 24.1ක් දක්වා 2019 වසරේ අග පැවති සියයට 19.2ක සිට වැඩි වූ අතර, මෙයට ප්‍රධාන වශයෙන් භාණ්ඩාගාර බිල්පත් මගින් ලබා ගත්, නොපියවූ ණය ප්‍රමාණයේ වැඩි වීම හේතු විය. 2020 ජූලි මස අග වන විට, සමස්ත දේශීය ණය ප්‍රමාණයෙන් භාණ්ඩාගාර බිල්පත්වල ප්‍රමාණය 2019 වසර අග වන විට පැවති සියයට 13.2ක සිට සියයට 14.9ක් දක්වා වැඩි වූ අතර, බැංකු අංශය සතු වූ භාණ්ඩාගාර බිල්පත්වල ප්‍රමාණය වැඩි වීම ප්‍රධාන

6

### 6.4 සංඛ්‍යා සටහන
### මධ්‍යම රජයේ නොපියවූ ණය

රු. බිලියන

| අයිතමය | 2018 | 2019 (අ) | 2019 ජූලි අවසානයට (අ) | 2020 ජූලි අවසානයට (අ) |
|---|---|---|---|---|
| **දේශීය ණය (ආ)** | **6,071.0** | **6,629.1** | **6,509.8** | **7,708.0** |
| කල්පිරීම අනුව | | | | |
| කෙටිකාලීන | 1,134.6 | 1,270.4 | 1,277.1 | 1,860.2 |
| මැදි හා දිගුකාලීන | 4,936.4 | 5,358.7 | 5,232.6 | 5,847.8 |
| ආයතන අනුව | | | | |
| බැංකු | 2,351.9 | 2,739.6 | 2,702.1 | 3,695.4 |
| බැංකු නොවන අංශය | 3,719.1 | 3,889.5 | 3,807.7 | 4,012.5 |
| **විදේශීය ණය (ඇ)** | **5,959.5** | **6,402.4** | **6,192.8** | **6,553.1** |
| සහනදායී | 2,705.8 | 2,767.5 | 2,620.3 | 2,911.6 |
| සහනදායී නොවන | 3,253.7 | 3,635.0 | 3,572.5 | 3,641.4 |
| **රජයේ මුළු ණය** | **12,030.5** | **13,031.5** | **12,702.6** | **14,261.0** |

මූලයන්: මුදල් අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

(ආ) රුපියල්වලින් නාමනය කරන ලද භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කරවල සිදු කළ විදේශ ආයෝජනවල නොපියවූ ප්‍රමාණය ඇතුළත් නොවන අතර, ශ්‍රීලංකන් ගුවන් සමාගමෙහි ප්‍රාග්ධනීකරණය සඳහා 2013 මාර්තු මස නිකුත් කරන ලද (2018 ජූනි 01 දින පරිණත වූ) රුපියල් මිලියන 13,125ක් වටිනා භාණ්ඩාගාර බැඳුම්කර සහ 2012 ජනවාරි මස ඛනිජතෙල් නීතිගත සංස්ථාව වෙත නිකුත් කරන ලද රුපියල් මිලියන 78,441ක් වටිනා භාණ්ඩාගාර බැඳුම්කර (මෙයින් රු. මිලියන 21,778ක් 2017 ජනවාරි 01 දින පරිණත වූ අතර දැනට පවත්නා ශේෂය රු. මිලියන 56,662ක් වේ.) ඇතුලත් වේ.

(ඇ) රුපියල්වලින් නාමනය කරන ලද භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කරවල සිදු කළ විදේශ ආයෝජනවල නොපියවූ ප්‍රමාණය ඇතුළත් වේ.

වශයෙන් මේ සඳහා හේතු විය. මේ අතර, 2020 ජූලි මස අග වන විට, සමස්ත දේශීය ණය ප්‍රමාණය තුළ මැදි හා දිගු කාලීන ණය ප්‍රමාණය 2019 වසර අවසානයට පැවති සියයට 80.8ක සිට සියයට 75.9ක් දක්වා අඩු විය. දේශීය ණය කළඹේ ප්‍රධානතම මූලාශ්‍රය වන භාණ්ඩාගාර බැඳුම්කරවල ප්‍රතිශතය 2019 වසර අග වන විට පැවති සියයට 69.5ක සිට 2020 ජූලි අග වන විට සියයට 66.4ක් දක්වා අඩු විය. සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ශුද්ධ ණය ආපසු ගෙවීම පිළිබිඹු කරමින්, 2020 ජූලි අග වන විට සමස්ත දේශීය ණය ප්‍රමාණයෙන් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ප්‍රතිශතය 2019 වසර අග වන විට පැවති සියයට 8.5ක සිට සියයට 6.1ක් දක්වා අඩු විය.


- **2020 වසරේ ජූලි මස අග වන විට විදේශීය ව්‍යවහාර මුදලින් නාමනය කරන ලද දේශීය ණය ප්‍රමාණය, 2019 වසර අවසානයට පැවති රුපියල් බිලියන 728.2ක සිට රුපියල් බිලියන 705.1ක් දක්වා අඩු විය.** 2020 ජූලි අග වන විට ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවලින් ලබා ගත් නොපියවූ ණය ප්‍රමාණය රුපියල් බිලියන 473.9ක් (එ.ජ. ඩොලර් මිලියන 2,552.3ක්) වූ අතර, විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක මගින් ලබා ගත් නොපියවූ ණය ප්‍රමාණය රුපියල් බිලියන 231.2ක් (එ.ජ. ඩොලර් මිලියන 1,245ක්) විය. 2020 ජූලි මස අග වන විට සමස්ත දේශීය ණය ප්‍රමාණයෙන් විදේශ ව්‍යවහාර මුදලින් නාමනය කරන ලද දේශීය ණය ප්‍රමාණය, 2019 වසර අවසානයට පැවති සියයට 11.0 සිට සියයට 9.1 දක්වා අඩු විය. මේ අතර, රුපියල්වලින් නාමනය කරන ලද දේශීය ණය ප්‍රමාණය 2020 ජූලි මස අග වන විට රුපියල් බිලියන 7,002.9ක් දක්වා රුපියල් බිලියන 1,102.0කින් සැලකිය යුතු ලෙස වැඩි විය.

- **2020 වසරේ ජූලි මස අග වන විට මධ්‍යම රජයේ විදේශීය ණය ප්‍රමාණයෙන් ප්‍රතිශතයක් ලෙස සහනදායී නොවන ණය ප්‍රමාණය, 2019 වසර අවසානයට පැවති සියයට 56.8ක සිට සියයට 55.6ක් දක්වා සුළු වශයෙන් අඩු විය.** නාමික වශයෙන් ගත් කළ, 2020 ජූලි මාසයෙන් අවසන් වන මාස හත තුළ දී ප්‍රධාන වශයෙන්, විදේශ ව්‍යවහාර කාලීන මූල්‍ය පහසුකම් නිකුතුව හේතුවෙන් නොපියවූ සහනදායී නොවන ණය ප්‍රමාණය රුපියල් බිලියන 3,641.4ක් දක්වා සියයට 0.2කින් සුළු වශයෙන් වැඩි විය. 2020 ජූලි මස අග වන විට සමස්ත විදේශ ණය ප්‍රමාණයෙන් සහනදායී විදේශ ණය ප්‍රමාණය 2019 වසර අවසානයේ පැවති සියයට 43.2ක සිට සියයට 44.4ක් දක්වා වැඩි විය.

### ණය සේවාකරණ ගෙවීම්

- **2020 වසරේ ජූලි මාසයෙන් අවසන් වන මාස හත තුළ දී ණය සේවාකරණ ගෙවීම් 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව රුපියල් බිලියන 1,190.9ක් දක්වා සියයට 17.0කින් අඩු විය.** 2020 ජනවාරි සිට ජූලි දක්වා කාලය තුළ ණය ආපසු ගෙවීම් 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ

### 6.6 රූප සටහන
### රාජ්‍ය ණය සේවාකරණ ගෙවීම් සහ රජයේ ආදායම (අ)




මූලයන්: මුදල් අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) 2020 දත්ත මහ බැංකුවේ ද.දේ.නි. පුරෝකථන මත පදනම් වේ

පැවති රුපියල් බිලියන 873.9ක සිට රුපියල් බිලියන 607.3ක් දක්වා අඩු වූ අතර, 2020 ජූලි මාසයෙන් අවසන් වන මාස හත තුළ දී ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ණය ආපසු ගෙවීමක් පෙර වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව වාර්තා නොවීම ප්‍රධාන වශයෙන් මේ සඳහා හේතු විය. 2020 ජූලි මාසයෙන් අවසන් වූ මාස හත තුළ පොළී ගෙවීම්, සලකා බලන කාල සීමාව තුළ ණය තොගයේ වැඩි වීමට සමගාමීව 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති රුපියල් බිලියන 561.6ක සිට රුපියල් බිලියන 583.6ක් දක්වා වැඩි විය. සමස්ත ණය සේවාකරණ ගෙවීම්වලින් දේශීය සහ විදේශීය ණය සේවාකරණ ගෙවීම් ප්‍රමාණය පිළිවෙළින් රුපියල් බිලියන 783.4ක් සහ රුපියල් බිලියන 407.6ක් විය.

## අපේක්ෂිත වර්ධනයන්

- **කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ආර්ථිකයේ පසුබෑමෙහි බලපෑම ප්‍රධාන වශයෙන් පිළිබිඹු කරමින් 2020 වසරේ දී ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂයන් 2019 වසර හා සසඳන විට අඩු ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කිරීමට අපේක්ෂිතය.** එසේ වුව ද, වසංගතය මධ්‍යයේ ව්‍යාපාර සහ කුටුම්භ සඳහා පෙර නොවූ විරූ ආකාරයේ රාජ්‍ය මූල්‍ය හා මූල්‍ය ප්‍රතිපත්ති උත්තේජක ලබා දීමේ සහාය මගින් ආර්ථික ක්‍රියාකාරකම්වල අපේක්ෂිත පුනර්ජීවනය හා සමගාමීව සමස්ත රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය 2021 වසරේ දී සහ ඉන් පසුව වැඩිදියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2020 නොවැම්බර් මස මැද දී ප්‍රකාශයට පත් කිරීමට නියමිත 2021 සඳහා වන රාජ්‍ය අයවැයේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති උපායමාර්ගය මගින් බදු ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණයන්හී ද සහාය ලබාගනිමින් මැදි කාලීන රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා මාවත ශක්තිමත් කිරීම අරමුණු කරනු ඇති අතර, ජාතික ප්‍රතිපත්ති රාමුව වන "රට හදන සෞභාග්‍යයේ දැක්ම" මගින් පැහැදිලි කළ පරිදි ආර්ථිකය උත්තේජනය කිරීම සඳහා රාජ්‍ය ආයෝජනවලට ප්‍රමුඛතාවය දීම සහ පුනරාවර්තන වියදම් තවදුරටත් තාර්කිකරණය කිරීම සිදු කරනු ඇත. මේ අතර, විදේශ ආයෝජන තුළින් ක්‍රියාත්මක කළ හැකි ව්‍යාපෘති හඳුනා ගැනීම මගින් රජයේ ඉදිරි ණය බර අඩු කර ගනිමින් රජයේ ප්‍රමුඛතා අනුව, විදේශීය අරමුදල් හරහා ක්‍රියාත්මක කෙරෙන ව්‍යාපෘති පෙළ ගැස්වීම සඳහා සමාලෝචනය කිරීමට රජය විසින් පියවර ගන්නා ලදී. මෙම වර්ධනයන් සමඟ 2021 වසරේ දී වර්තන ගිණුමේ සහ ප්‍රාථමික ගිණුමේ ශේෂයන් හා සමගාමීව සමස්ත අයවැය ශේෂය වැඩිදියුණු කර ගැනීමට හැකි වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස අයවැය හිඟය මූල්‍යනය පහළ යෑමත් එමගින් නොපියවූ මධ්‍යම රජයේ ණය අඩුවීමත් සිදු වනු ඇත. තව ද, ජාත්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන විසින් ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් පහත හෙළීම හේතුවෙන් ඇති වූ අහිතකර සමපේක්ෂණ අපේක්ෂා සහ අවිනිශ්චිතතාවයන් මධ්‍යයේ වුව ද, රජය විසින් එළඹෙන සියලුම ණය සේවාකරණ ගෙවීම් නිසි පරිදි සිදු කිරීමට සහ රාජ්‍ය මූල්‍ය තිරසාර බව සහතික කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට අපේක්ෂිතය.

6